# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/34 - 2017 දෙසැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2017.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/COM/01/W/2015/141

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.08.22 දිනැති හා අංක 1981/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.08.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතර උයන්වත්ත දකුණ, පිලදූව පටුමග, නො. 08 හි පදිංචි පී. එච්. ජී. අමිල මහීපා ශීලන්ත මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.10.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය : IR/COM/01/W/2015/141

කාර්මික අධිකරණයේ දී ය.

පී. එච්. ජී. අමිල මහීපා ශීලන්ත,
අංක 08, පිලදූව පටුමග,
උයන්වත්ත දකුණ,
මාතර

නඩු අංකය : A3656

එරෙහිව

ඉල්ලුම්කරු

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධව

ප්‍රදානයයි

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා හට වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.08.16 දිනැති නියෝගයෙන් මා පත් කොට මා හට යොමුකොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර වූ කාර්මික ආරවුලට හේතු වී පැවති කරුණ වූයේ :-

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මාතර ඩිපෝවේ කම්කරුවෙකු ලෙස සේවය කරනු ලබන පී. එච්. ජී. අමිල් මහීපා ශීලන්ත මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2012.04.09 දින හෝ ඊට ආසන්න දිනයකදී සිදුවූ කලහකාරී ක්‍රියාවක් සම්බන්ධයෙන් 2012.07.22 දාතමින් යුතුව ඔහුට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර විනය පරීක්ෂණයක් පවත්වා ඔහු වෙත ලබා දී ඇති දඬුවම් සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද යන්න සහ 2014.07.01 දින සිට 2014.10.01 දින දක්වා සේවය අත්හිටවූ කාලයට ඔහු හට වැටුප් නො ගෙවීම සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද යන්නත් එසේ සාධාරණ හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහු හට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

කාර්මික ආරවුල් පනත හා අදාළ නියෝග සංග්‍රහය ප්‍රකාරව දෙපාර්ශ්වය අතර හේතු ප්‍රකාශ හුවමාරු කරවීමෙන් පසුව




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දෙපාර්ශ්වයේ යම් සමථයක් වේ නම් බේරුම්කරණය වෙත දැනුම් දෙන ලෙසට නියෝග කරන ලදුව ඊට දෙපාර්ශ්වය ප්‍රතිචාර දක්වනු ලැබිය.

එකී සමථය පරිදි අදාළ කාර්මික ආරවුල හේතුවෙන් ඉල්ලුම්කරුට සිදුව ඇති මූල්‍යමය හානිය මාස 03 වැටුප එනම් රු. 70,000/- ක් මුදලක් නොලැබී යාම බැවින් එය ලබා දෙන්නේ නම් සමථයෙන් ආරවුල විසඳා ගත හැකි බව ඉල්ලුම්කාර පාර්ශ්වය ප්‍රකාශ කරන ලදී.

එකී සමථ යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා අදාළ තීරණය බේරුම්කරණය වෙත ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුගේ නීති නිලධාරිණියට ඒ සඳහා කිසියම් කාලයක් ලබා දෙන ලෙස ඉල්ලූ හෙයින් ඊට ඉඩ ලබා දුනිමි.

ඒ අනුව වර්ෂ 2017.07.06 දින ඉල්ලුම්කරු වෙත, 2017.07.04 දිනැති මහජන බැංකු යූනියන් පෙදෙස ශාඛාවේ අංක 268257 දරන රු. 70,000/- වටිනා චෙක්පත භාර දීමෙන් ඔහු විසින් අත්සන් කොට පූර්ණ හා අවසානාත්මක සමථයක් ලෙස ඉහත කී කාර්මික ආරවුල සමථයකින් අවසානයට පත් කරවන ලදී.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බැව් සහතික කරමි.

එස්. කාරියවසම්,
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2017 ඔක්තෝබර් මස 31 වැනි දින දීය.

12 - 709

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.